**පොතුවිල් ප්‍රාදේශීය සභාව - 2023**
**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පොතුවිල් ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පොතුවිල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්‍ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන 1.6.1 (ආ) හැර ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ දී මහේන්ද්‍රා කැබ් රථයට කර තිබූ රු. 219,500 ක ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් වල වටිනාකම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | ජර්නල් සටහනක් මගින් ප්‍රාග්ධන වියදම් ලෙස මාරුකිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ආ) | ප්‍රාග්ධන වියදම් සඳහා වන රජයේ ආධාර මුදලේ ආරම්භක ශේෂය ඉදිරියට ගෙන නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල රු. 296,937,210 කින් ප්‍රාග්ධන වියදම් සඳහා වන රජයේ ආධාර අඩුවෙන් දක්වා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ආරම්භක ශේෂය නිවැරදිව ඉදිරියට ගෙන ඒමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 10,495,411 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 18,181,148 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,500,000 | 3,500,000 | 130,000 | 3,370,000 | 1,625,000 | 1,625,000 | 750,000 | 875,000 |
| (ii) | කුලී | 19,750,000 | 34,284,358 | 10,941,288 | 23,343,070 | 18,820,000 | 29,462,566 | 7,831,967 | 13,568,608 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 5,010,000 | 5,010,000 | 4,062,720 | 947,280 | 4,910,000 | 2,642,220 | 2,642,220 | 2,267,780 |
| (iv) | වෙනත් ආදායම් | 9,205,000 | 9,205,000 | 4,793,278 | 4,411,721 | 8,705,000 | 5,798,665 | 5,798,665 | 2,906,334 |
| | | 37,465,000 | 51,999,358 | 19,927,286 | 32,072,071 | 34,060,000 | 39,528,451 | 17,022,852 | 19,617,722 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් දිනට අයවිය යුතු වෙළඳපොළ කඩකාමර කුලී රු. 5,042,520 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ අයකර ගැනිමට කටයුතු කර අයකරමින් පවතින බව. | හිඟ ආදායම් අයකිරීම් කඩිනම් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොදු වෙළඳපොළ කඩකාමර 33 ක් සඳහා ඇති කරගත් ගිවිසුම්වල කුලීහිමියන් කිසිදු අත්සනක් යොදා නොමැති අතර, එම ගිවිසුමේ කොන්දේසිවලට අනුව, කුලීහිමියන් 17 දෙනෙකුගෙන් කිසිදු හිඟයක් සමාලෝචිත වර්ෂයතුල අය කර නොමැති අතර ගිවිසුමේ අඩුපාඩු හේතුවෙන් අයවියයුතු රු.1,608,000ක හිඟ කුලිය නීතිමය ක්‍රියාමාර්ග වලින් අයකර ගැනීමටද සභාවට නොහැකි වී තිබුණි. | පසුගිය කාලයේ ගිවිසුම් නොමැති නිසා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැක. කෙසේ වෙතත්, එකඟතාවය මත හිඟ අයකිරීමට කටයුතු කර ඇති බව. | සුදුසු ක්‍රමවේදයන් සකස් කර හිඟ මුදල් කඩිනමින් අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජාත්‍යන්තර ස්වෙච්ඡා ආයතනයක් විසින් 2013 වර්ෂයේ සභාවට ලබා දී තිබූ ඩබල් කැබ් රථයේ අයිතිය පවරා නොගැනීම හේතුවෙන් 2022 වර්ෂයේ අනතුරට ලක්වී අලුත්වැඩියා කිරීම සඳහා දරන ලද රු. 235,000 ක්, රක්ෂණය මගින් මුදල ලබා ගැනීමට නොහැකිව සභා අරමුදලින් වැය කර තිබුණි. | අයිතිය පවරා ගැනිම සම්බන්ධයෙන් කටයුතුකර ඔබ වෙත වාර්තා කරන බව. | අයිතිය කඩිනමින් පවරා ගැනිමට කටයුතු කළ යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් භාවිතා කරන වාහන 11 ක අයිතිය සභාවේ නමට පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවේ වාහන කිහිපයක් හැර අනෙකුත් සියලුම වාහන පවරාගෙන ඇති බව | පවරා නොගත් වාහන ලැයිස්තුගත කර කඩිනමින් සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 ජූලි 20 වැනි දින රු.14,693,782කට මිලදී ගෙන තිබුණු ඔයිල් එක්ස්පෙලර්, ((Oil Expeller),සහ ඔයිල් පිල්ටර් (Oil Filter), කොප්රා ඩ්‍රයර්(Coprara Dryer),සහ ස්කේල් යන්ත්‍රයක් (Scale Machine),කොප්රා කටර් (Copara Cutter) සහ හිස් බෝතල් (;(Empty Bottles)වැනි ද්‍රව්‍ය ස්ථාපනය නොකර අනාරක්ෂිත ස්ථානයක ගබඩා කර තිබුණි. | පිළිතුරක් ලබා දී නොමැත. | අදාළ අරමුණු සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථිර සහ තාවකාලික නිලධාරින් 21 දෙනෙකුගෙන් රු. 785,135 ක හිඟ ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර සේවක ණය ලේඛනයේ ණය ලබා ගත් සියලුම නිලධාරින්ගේ තොරතුරු ඇතුළත් කර නොතිබුණි. | අයකිරීට කටයුතු කර වාර්තා කරන බව. | අදාළ නිලධාරීන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් කඩිනමින් අයකිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු වාහන 16 ක් අලුත්වැඩියා කර නැවත භාවිත කිරීමට හෝ එය අපහරණය කිරීමට හෝ සභාව කටයුතු කර නොතිබුණි. | මේ වන විට මෙයට අදාළ කටයුතු සිදු කර ඇත. | අලුත්වැඩියා කර නැවත භාවිතා කිරිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වාහන හතරක් භාවිතයට ගත නොහැකි ලෙස පසුගිය වසර 8කට වැඩි කාලයක සිට සභාවේ ගාල් කර තිබුණු අතර ඒවා වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ කටයුතු මේ වන විට සිදු කර ඇත. | නිසි අනුමැතිය ලබාගෙන වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පසුගිය වර්ෂවල පරිසර බලපත්‍ර ලබාගෙන ඇති කර්මාන්ත ආයතන 23ක කල් ඉකුත් වූ බලපත්‍ර අලුත් කිරීමට සහ ලියාපදිංචි නොකළ කර්මාන්ත ආයතන හඳුනාගෙන ලේඛන පවත්වාගෙන යාමට සභාව කටයුතු කර නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය ආයතන පිළිබඳ දත්ත රැස් කර ඒවා ලියාපදිංචි කිරීමට කටයුතු කෙරේ. | පරිසර බලපත්‍ර නිකුත් කිරීමට සහ අලුත් කිරීමට කටයුතු කළ යුතුය. |